ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

ඔබේ අංකය
உமது இல.
Your No.

අපේ අංකය
எமது இல.
Our No.

දිනය
திகதி
Date

ප්‍රවෘත්ති නිවේදනය

2023 අගෝස්තු 11

ජාතික විදුලිබල පද්ධතිය දකුණු පළාත සමග සම්බන්ධ කරන සම්ප්‍රේශන රැහැනෙහි රත්නපුර සිරිපාගම ප්‍රදේශයේ ඉඩමක් හරහා දිවෙන කොටස සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය හා අදාල ඉඩමෙහි හිමිකරුවන් අතර ආරවුල විසඳීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අද සමත් වුණා. ඒ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2009 අංක 20 ශ්‍රී ලංකා විදුලිබල පනතේ 53 වන වගන්තිය යටතේ 2015 ජනවාරි 25 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පල කරන ලද විදුලිබල ආරාවුල් නිරවුල් කිරීමේ කාර්ය පටිපාටි වලට අනුකුලව අද පැවති සමථකරණ ක්‍රියාවලියේදී ය. සම්ප්‍රේශණ රැහනෙහි මීටර 630ක කොටසක් ඉදිකිරීමේදී අහිමි වන ඉඩම් කොටසේ වන්දිය වශයෙන් පුද්ගලික තක්සේරුකරුවන් විසින් රුපියල් මිලියන 41.35 ක් නිර්දේශ වී තිබූ අතර පසුව ආසියානු සංවර්ධන අරමුදලේ නිර්ණායක අනුව වන්දි වශයෙන් රුපියල් මිලියන 9.6 ක් වශයෙන් ගණනය කර තිබිණ. එහෙත් ලංකා විදුලිබල මණ්ඩලය එකගතාව පල කර තිබුණේ රුපියල් මිලියන 1.69 ක වන්දි මුදලක් සදහා. ලංකා විදුලිබල මණ්ඩලය මෙම ආරාවුල ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට අගෝස්තු 2 වැනිදා යොමු කර තිබූ අතර දින 8 ක් ඇතුළත ආරාවුල විසඳීමට සමත් වුණා. ඉඩමෙහි හිමිකරුවන් වන රත්නපුර ප්‍රදේශයේ පවුලක සාමාජකයින් විසින් රටේ වත්මන් විදුලි අවශ්‍යතාව පිළිබඳ සැළකිල්ල දක්වමින් පොදු ජනතාවට අපහසුවක් නොවන පරිදි අඛණ්ඩ විදුලි සැපයුමකට දායක වීම සඳහා අදාල ඉඩම කිසිදු වන්දියකින් තොරව රජයට පරිත්‍යාග කිරීමට අද එකගතාවය පල කලේ ය. ඒ අනුව මෙම එකගතාව පිළිබඳ ගිවිසුමට අදාල පවුලේ සමාජිකයින් සහ ලංකා විදුලි බල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සමථකරණ මණ්ඩලය ඉදිරිපිටදි අත්සන් කලේ ය. ඒ අනුව අදාල සම්ප්‍රේශණ රැහැන ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට ද මෙම ගිවිසුම මගින් පහසුකම් සලසා ඇත. ලංකා විදුලි බල මණ්ඩලයේ යෝජිත සැලැස්මට අනුව අදාල විදුලි රැහැන මෙම පුද්ගලික ඉඩම හරහා ඉදිකිරීමටද අවම උස මීටර් 20 තබා ඉදිකිරීමට ද පොලව මට්ටමේ සිට මීටර 16 දක්වා ගොඩනැගිලි ඉදිකිරීමට හා වගා කටයුතු කල හැකි ආකාරයට රැහැන ඉදිකිරීමට ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පනවා ඇති විදුලි ආරක්ෂාව තත්වය හා අඛණ්ඩතාවය පිළිබඳ රෙගුලාසි වලට යටත්ව රැහැන ඉදිකිරීමට ද මෙහිදී දෙපාර්ශ්වය විසින් එකග විය. මෙම එකගතාව අද දින සිට බලාත්මක වේ.

ඉහත ආකාරයේ විදුලිබල කර්මාන්තයට අදාල ආරාවුල් සමථකරණය මගින් විසඳීමට ශ්‍රී ලංකා විදුලිබල පනතේ 39 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට පවරා ඇත. විදුලිබල සේවා සපයන බලපත්‍රලාභී ආයතන අතර සහ විදුලි පාරිභෝගිකයින් ඇතුළු වෙනත් පාර්ශ්වයන් ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම අතර ඇතිවන ආරාවුල් කාර්යක්ෂමව විසඳීම සඳහා ආරාවුල් නිරවුල් කිරීමේ ක්‍රමවේදය 2011 වසරේදී හදුන්වා දෙන ලදී. එම කාර්ය පටිපාටි 2015 වසරේදී යාවත් කාලීන කර ඇත. මෙම ආරාවුල් නිරවුල් කිරීමේ ක්‍රමවේදය හේතුවෙන් විදුලි බල අංශයේ පැමිණිලි හා ආරාවුල් කාර්යක්ෂම ව විසඳීමට හැකියාව ලැබී ඇත. ඉහත සම්ප්‍රේශණ රැහැනට අදාල ආරාවුල නිරවුල් කිරීමේ කමිටුවෙහි සභාපති වරයා වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පාරිභෝගික කටයුතු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ රෝෂන් වීරසුරිය මහතා ක්‍රියාකල අතර පළපුරුද්දක් ඇති බාහිර සාමාජිකයින් වශයෙන් නීතිඥ සී එල්ලාවල මහත්මිය සහ ඉංජිනේරු ගාමිණි සේනානායක මහතා කටයුතු කරන ලදී.

වැඩිදුර විස්තර සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ආයතනික සන්නිවේදන අංශයේ අධ්‍යක්ෂ ජයනාත් හේරත් (077 2 943 193) මහතා අමතන්න

මහාචාර්ය මංජුල ප්‍රනාන්දු
සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ඇමුණුම

විදුලිබල ආරාවුල් නිරවුල් කිරීමේ පටිපාටිය පිළිබඳ අති විශේෂ ගැසට් නිවේදනය

06.වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 28. ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
06 ஆவது மாடி, இலங்கை வங்கி வர்த்தகக் கோபுரம், 28, சென் மைக்கல் வீதி, கொழும்பு 03.
Level 06, BOC Merchant Tower, 28, St. Michael's Road, Colombo 03, Sri Lanka.

Tel : +94 11 2392607/8 Fax : +94 11 2392641 E-mail : info@pucsl.gov.lk Web : www.pucsl.gov.lk

සභාපති / தலைவர் / Chairman +94 11 2392606
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General +94 11 2392606

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

EXTRAORDINARY

අංක 1951/1 - 2016 ජනවාරි මස 25 වැනි සඳුදා - 2016.01.25

No. 1951/1 - MONDAY JANUARY 25, 2016

**(Published by Authority)**

# PART I : SECTION (I) — GENERAL

## Government Notifications

L. D. B. 3/2009

**SRI LANKA ELECTRICITY ACT, NO. 20 OF 2009**

RULES made by the Public Utilities Commission of Sri Lanka under section 53 of the Sri Lanka Electricity Act, No.20 of 2009, read with sub sections (1) and (3) of section 39 of the aforesaid Act.

Chairman,
Public Utilities Commission of Sri Lanka.

Colombo,
25.01.2015.

**Rules**

1. (1) These Rules may be cited as the Electricity (Dispute Resolution Procedure) Rules.

(2) The Electricity (Dispute Resolution Procedure) Rules published in *Gazette Extraordinary* No.1707/15 dated 25.05.2011 are hereby rescinded.

(3) For the avoidance of doubt it is hereby stated that all the mediation, arbitration and court proceedings that have been commenced under the Rules published in the said *Gazette* and are still pending shall continue to be in force until their conclusion under the relevant procedure.

2. These Rules shall apply to -

(1) the procedures specified in PART I below which relates to resolution of disputes arising between following categories:-

(a) disputes between a licensee and a tariff customer arising under sections 25 to 30 or Schedules I, II or III of the Act;

*N. B.* - *Gazette Extraordinary* Series No. 1950/1 ends with 1950/52.
*This Gazette Extraordinary can be downloaded from* www.documents.gov.lk

(b) disputes other than those specified in paragraph (a) above and arising between a licensee and a tariff customer;

(c) disputes arising between a licensee and any other affected party; and

(d) disputes arising between a licensee and another licensee

(2) the procedure specified in PART II below which shall be followed in the resolution of disputes referred to the Commission where the parties to a dispute referred to in PART I fail to come to a settlement.

PART I

**A. Resolution of disputes falling under Rule 2(1)(a), (b) and (c).**

3. A tariff customer or any other affected party who has a dispute specified under Rule 2(l)(a), (b) or (c) with a licensee and wishes to resolve such dispute may, for that purpose, send to the Deputy General Manager of the respective Distribution, Transmission or Generation licensee of Ceylon Electricity Board (CEB), or Head of Operations of Lanka Electricity Company (Private) Limited (LECO) (hereinafter referred to as the "Dispute Resolution Officer") a written request substantially in Form A set out in the Schedule to these Rules, setting out the matter in dispute and any other facts that such tariff customer or any other affected party considers to be relevant there to, including a proposal for the resolution of the same.

4. Within ten (10) working days of the date of receipt of the request referred to in Rule 3, the Dispute Resolution

Officer shall arrange a meeting between the two disputant parties,— Viz ;-

(i) the tariff customer or other affected party ; and

(ii) the officer responsible for the matter in dispute, (hereinafter referred to as the "Relevant Officer"),

and upon so meeting, both parties shall use their best efforts to resolve the dispute by reaching at a mutually acceptable settlement, with the help of the Dispute Resolution Officer.

5. Where the parties to the dispute are able to reach a settlement, such settlement shall be reduced to writing which shall be substantially in Form B set out in the Schedule to these Rules and shall be signed by both parties and also by the Dispute Resolution Officer, in proof of such settlement.

6. Where the parties to the dispute fail to reach a settlement which is acceptable to both parties within ten (10) working days of the date of the meeting specified in Rule 4, they shall sign a document to that effect which shall be substantially in Form C set out in the Schedule to these Rules and shall be endorsed by the Dispute Resolution Officer.

**B. Resolution of disputes falling under Rule 2(1)(d)**

7. A licensee who has a dispute with another licensee as is specified under Rule 2(1)( d) and who wishes to resolve the same may, send a written request which shall be substantially in Form A set out in the Schedule to these Rules, to the other licensee, setting out the matter in dispute and any other facts that the Licensee considerers to be relevant under the circumstances, including a proposal for the resolution of the same. The Licensee shall also include the names and contact numbers of three persons, one of whom shall be selected by the consent of both parties, to be an Evaluator to help them in their attempt to solve the dispute.

8. Within a period of five (5) working days of the date of receipt of the said written request specified in the preceding Rule 7 by the other party, the licensees along with their Evaluator shall meet at a venue convenient to all the parties, at which meeting, the parties to the dispute shall submit their dispute to the Evaluator.

9. With the assistance of the Evaluator the parties shall make every effort to reach at a settlement. The opinion of the Evaluator shall not be binding, but shall be taken in to consideration by the parties in their attempt at reaching a settlement.

10. Where the parties are able to reach a settlement, such settlement shall be reduced to writing and shall be substantially in Form B set out in the Schedule to these Rules and shall be signed by both parties to the dispute and also by the Evaluator in proof of such settlement.

11. Where parties to the dispute fail to reach a settlement which is acceptable to both parties within ten (10) working days of the date of the meeting, they shall sign a document to that effect which shall be substantially in Form C set out in the Schedule hereto, which shall be endorsed by the Evaluator.

## PART II

12. Where the parties to a dispute referred to in PART I fail to reach at a settlement which is acceptable to both parties and signed a document as is referred to under Rule 6 or Rule 11, as the case may be, either party to the dispute may, by written communication which shall be substantially in Form D set out in the Schedule hereto, inform the Commission of such failure and shall call upon the Commission to resolve same.

13. Where a dispute falling under category (a) of Rule 2(1) is referred to the Commission, it shall within five (5) working days of such referral, appoint, for the purpose of resolving the dispute in issue a Panel of Mediators, which shall consist of three (3) persons one of whom shall be a member of the Commission or a member of the staff of the Commission or a public officer who shall be the Chairperson of the Panel and two (2) other members who shall be appointed from among retired public officers, having experience in the matters to which such dispute relates.

14. Where a dispute falling under the category of (b), (c) and (d) of Rule 2(1) is referred to the Commission under Rule 12, the Commission shall, within five (5) working days of such referral, conduct a pre-mediation assessment in order to decide whether it is more appropriate for the dispute to be determined either by the court or through arbitration rather than through mediation and -

(a) if the Commission decides that it is more appropriate for the dispute to be determined either by the Courts or through arbitration, it shall communicate such decision to the parties to the dispute within ten (10) working days of the date of such referral; or

(b) if the Commission decides otherwise, it shall, within ten (l0) working days of such referral made under Rule 12, appoint a panel of Mediators which shall consist of three (3) persons one of whom shall be a member of the Commission or a member of the staff of the Commission or a public officer who shall be the Chairperson of the Panel and the other two (2) members who shall be appointed from among retired public officers who have experience in the matters to which such dispute relates.

15. When appointing Mediators for the purpose of Rule 13 or 14, the Commission shall have regard to the qualifications and experience of such appointees as may be determined by the Commission.

16. The Panel of Mediators (appointed under these rules), in facilitating a resolution to a dispute before them, shall follow the practice and procedure given below:-

(a) within five (5) working days of the date of appointment of the Panel of Mediators under this Rules, parties to the dispute and such other parties whose presence is considered to be necessary for the purpose of resolving the dispute shall be notified in writing, to be present at a mediation conference, together or individually, at a time and place specified in the notification;

(b) convene such number of mediation conferences as may be necessary in order to facilitate amicable settlement to the dispute by the parties;

(c) maintain confidentiality in respect of all documents and information submitted by the parties and of any other matters that are revealed or discussed during the conduct of the mediation conferences;

(d) endeavor, by using appropriate listening, communication and mediation skills, to cause the parties to the dispute to reach an amicable settlement which is acceptable to both parties;

(e) throughout the mediation process, maintain independence, neutrality and impartiality;

(f) conclude its deliberation within the period specified when the Panel of Mediators is appointed;

(g) at the end of its deliberation:–

(i) if a settlement is reached between the parties, such settlement shall be reduced to writing (as per the format given in FORM E of the SCHEDULE) and both parties shall affix their signatures to the document signifying their agreement to the terms of such settlement, and the Panel of Mediators shall affix their signatures certifying that the dispute has been resolved under these rules; or

(ii) if settlement could not be reached between the parties, a certificate of non-settlement (as per the format given in FORM F of the SCHEDULE) shall be issued by the Commission certifying that the dispute has been attempted to be resolved by mediation, but failed.

17. The Commission may at the end of all deliberations by the Panel of Mediators pertaining to mediating and resolving a dispute, may charge from either party a sum in respect of the costs or expenses incurred by the Commission. The amount to be charged and the proportion to be recovered from each party shall be determined by the Commission, having regard to the conduct and means of the parties and any other relevant circumstances. The following criteria shall be applied in determining the amount to be charged -

(a) disputes falling under category (a) of rule 2(1) - no costs or expenses shall be recovered from the parties to the dispute;

(b) disputes falling under category (b) and (c) of Rule 2(1) - no costs or expenses shall be recovered, if the parties to the dispute arrived at an amicable settlement at the end of the first mediation conference held in that regard and if no such settlement is reached, costs or expenses incurred by the Commission shall be recovered from parties in equal proportions;

(c) disputes falling under category (d) of Rule 2(1) - costs and expenses incurred by the Commission shall be recovered from parties in equal proportions.

18. All communications between the parties to a dispute under these rules shall be made in writing and, unless the parties have agreed to any other means of services such as facsimile or electronic mail, shall be sent by registered post and shall be deemed to have been received by the other party on the next day of delivery of mail immediately following the date of posting. Where the parties have agreed upon any other means of service, the communication shall be deemed to have been received only upon acknowledgement of the receipt thereof by the other party.

19. References, communications and submissions may be made to the Commission by registered post, facsimile, electronic mail or through any other means of communication made available by the Commission. The references, communications and submissions made *via* any mode of communication referred to above except in the case of registered post, shall be deemed to be received only upon acknowledgement of receipt thereof by the Commission.

20. Every person who contravenes any of the provisions of these rules or any requirement imposed under any of these rules shall be guilty of an offence under the Act.

21. In these Rules unless the context otherwise requires :–

"Act" means the Sri Lanka Electricity Act No. 20 of 2009 :

"Commission" means the Public Utilities Commission of Sri Lanka, established by the Public Utilities Commission of Sri Lanka Act, No. 35 of 2002;

"dispute" means a disagreement arising between a licensee and a tariff customer; licensee and another licensee, or a licensee and any other affected party, in connection with the supply or use of electricity, as referred to in subsection (1) of section 39 of the Act;

"distribution licensee" means a person who has been granted a distribution licence;

"licensee" means a person who has been granted a generation, transmission or distribution licence under the Act;

"tariff customer" means a person who requires a supply of electricity from a distribution licensee in pursuance of section 25 of the Act and is supplied as such by the distribution licensee.

**SCHEDULE**

FORM A

[Rule 3 and Rule 7]

[Postal address of a tariff customer or other affected party or licensee - 1]
[Contact number]
[Electricity account number (in the case of a tariff customer) or reference number of any agreement entered into between the parties (if any)]

[Complaint reference number obtained from the respective Relevant Officer (in the case of a tariff customer or other affected party)]

[Date]
[Deputy General Manager (in the case of CEB)]
Name of Distribution Province
Or
[Head of Operations (in the case of LECO)]
Or
[Deputy General Manager, Transmission]
Or
[Deputy General Manager, Generation]
Or

Lisensee – 2
[Postal Address]

**REQUEST FOR THE RESOLUTION OF A DISPUTE BY THE PARTIES TO THE DISPUTE**

In terms of Part I of the Electricity (Dispute Resolution) Rules made by the Public Utilities Commission of Sri Lanka, I hereby request your intervention for the resolution of the dispute set out below :-

(a) Explanation of the matter in dispute

(b) Details of the Relevant Officer or any other officer who is related to the dispute (not applicable to Licensee - 1 or Licensee - 2):

(c) Facts relevant to the dispute (further to explanation given under (a) above) :

(d) Proposal for the resolution

(e) Proposed three names to be selected one as the Evaluator (applicable to Licensee - 1 or Licensee - 2 only)

1............................

2............................

3............................

Please inform me of the meeting arranged in this regard as per terms of the aforementioned Rules, via the contact details given above.

..........................................
[Name of the disputant party]

[Rule 5 and Rule 10]

FORM B

**MEMORANDUM OF AGREEMENT**

This agreement is entered into between............................................ (full name of the tariff customer, the affected party or Licensee - 1) ................and .................. (Relevant Officer or Licensee - 2)............... at.............

Terms of agreement :

1. .............................
2. .............................
3. .............................
4. .............................
5. .............................

..................................
[Signature of tariff customer, the affected party or the representative of the Licensee -1 ]
Name :
Organization : (if applicable)
NIC No.

......................................
[Signature of Relevant Officer, or the representative of the Licensee -2]
Name :
Designation :

................................
Witness I

Name :
NIC No.

...................................
Witness 2

Name :
NIC No.

..............................................
Signature of the Dispute Resolution Officer/Evaluator
Name :
Designation :
Place :
Date :

FORM C

[Rule 6 and Rule 11]

**CERTIFICATE OF NON-SETTLEMENT**

I the undersigned hereby declare that the dispute between the parties specified below has been referred to me as the "Dispute Resolution Officer" or the "Evaluator" as the case may be for settlement, and that no settlement in respect of such dispute has been possible under the provisions of the Electricity (Dispute Resolution Procedure) Rules under the Sri Lanka Electricity Act, No. 20 of 2009.

Parties to the dispute :

1. (Full name of tariff customer or affected party)

2. (name and designation of the Relevant Officer)

or

1. Licensee - 1

2. Licensee - 2
(as applicable)

Matter in dispute : (in brief) :

Reference Number :

Date of referral :

Date/dates of conferences :

Reasons for non-settlement

............................................
Dispute Resolution Officer/Evaluator.

Name : Date :

Designation :

[Rule 12]

**FORM D**

[Name of the disputant party - 1]

[Designation]

[Contact number]

[Compliant/dispute reference number]

[Date]

Director-General,
Public Utilities Commission of Sri Lanka.

**REFERAL OF A DISPUTE TO THE PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA**

In terms of the Electricity (Dispute Resolution Procedure) Rules, I.................... (name and designation of the disputant party -1 ) hereby refer a dispute to the Public Utilities Commission of Sri Lanka to be resolved by the said Commission. I also state that despite the best effort taken by the parties in order to resolve the dispute (the minutes of the meetings held are attached herewith) the parties were unable to come to an agreement.

Category of dispute :

☐ Licensee vs. a tariff customer arising under Sections 25-30 or Schedules I, II or III to the Sri Lanka Electricity Act

☐ Licensee vs. a tariff customer (other than above)

☐ Licensee vs. any other affected party

☐ Licensee vs. another licensee

Details of the disputant party - 2 :

Name :

Designation :

Contact Number :

Details of other party to the dispute :

Name :

Postal Address :

Contact Number :

Electricity account number (in the case of a tariff customer) or reference number of any agreement entered into between the parties (if any) :

Matter in dispute :

Proposal(s) made by the disputant party - 2 for the resolution of the dispute :

Response(s) of disputant party - 1 with respect to above proposals (including reasons for not agreeing to the same ) :

Proposal(s) for the resolution of the dispute :

................................................
[name and signature of the disputant party - 1]

Attachments - check list :

☐ Written request received from the tariff customer/another licensee/other affected party requesting a resolution for the dispute

☐ Minutes of the meetings held to endeavor to reach a mutually acceptable settlement (signed by both parties)

☐ Copies of any written agreement(s) that the parties had entered into

[Rule 16(g) (i)]

FORM E

**SETTLEMENT AGREEMENT**

PUCSL Reference Number :..................................

Date of reference :.................................................

This agreement is entered into between.........................................(full name of the disputant party - 1) and ............................(full name of disputant Party-2)..........at the office of the Public Utilities Commission of Sri Lanka.

Terms of agreement :

1. .................................

2. .................................

3. ................................

4. .................................

5. .................................

| | |
|---|---|
| .............................. | ...................................... |
| Signature of disputant party - 1 | Signature of disputant party - 2 |

Name :
Organization : (if applicable)
NIC No.

Name :
Designation :

We hereby certify that the dispute (reference number.................) between the above parties was resolved by mediation in terms of the Electricity (Dispute Resolution) Rules.

| | | |
|---|---|---|
| .......................... | ................................. | ................................ |
| Chairman of the Panel of Mediators | Member of the Panel of Mediators | Member of the Panel of Mediators |
| Name : | Name : | Name : |

Date :.............................

[Rule 16 (g) (ii)]

FORM F

**CERTIFICATE OF NON-SETTLEMENT**

I the undersigned hereby declare that the dispute between the parties specified below has been referred to the Public Utilities Commission ("Commission") of Sri Lanka for settlemnt, and that no settlement by mediation in respect of such dispute has been possible under the provisions of the Electricity (Dispute Resolution Procedure) Rules of the Commission under the Sri Lanka Elecricity Act, No. 20 of 2009.

Parties to the dispute :

1. (full name of disputant party - 1)

2. (full name of disputant party - 2)

Matter in dispute : (in brief) :

PUCSL Reference Number :

Date of referral to PUCSL :

Date/dates of mediation conferences :

Reasons for non-settlement :

..................................
Chairman of the Panel of Mediators

Name : Date :

---

I hereby certify that the above declaration may be considered as the opinion of the Public Utilities Commission of Sri Lanka.

...........................................
Chairman, Public Utilities Commission of Sri Lanka.

Name: Date:

02-185

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1951/1 - 2016 ජනවාරි මස 25 වැනි සඳුදා - 2016.01.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2009.

### 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 39 වැනි වගන්තියේ (1) සහ (3) උපවගන්ති සමග කියවිය යුතු, පනතේ 53 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

2016 ක් වූ ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

### රීති

1. (1) මෙම රීති, විදුලිබල (ආරවුල් නිරවුල් කිරීමේ කාර්ය පටිපාටිය) රීති ලෙස හඳුන්වනු ලැබේ.
   (2) 2011.05.25 දිනැති අංක 1707/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද විදුලිබල (ආරවුල් නිරවුල් කිරීමේ කාර්ය පටිපාටිය) රීති මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.
   (3) සැක දුරු කිරීම සඳහා එකී ගැසට් පත්‍රය මගින් නිකුත් කළ රීති යටතේ ආරම්භ කරන ලද හා දැනටත් පවතින සියලු සමථකරණයන්, බේරුම් කිරීම් හා උසාවි ක්‍රියාමාර්ග අදාළ කාර්ය පටිපාටිය යටතේ විසඳුමක් ලැබෙන තුරු බලාත්මකව පවතින බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

2. මෙම රීති -
   (1) පැනනගින ආරවුල් නිරවුල් කිරීමට පහත I වන කොටසේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටි අදාළ වන පහත දැක්වෙන කාණ්ඩ වන :-
   (අ) පනතේ 25 සිට 30 දක්වා වගන්ති හෝ උපලේඛන I, II, හෝ III යටතේ බලපත්‍රලාභියකු හා අයකුම පාරිභෝගිකයකු අතර ඇති වන ආරවුල් ;
   (ආ) ඉහත (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ආරවුල් හැර බලපත්‍රලාභියකු හා අයකුම පාරිභෝගිකයකු අතර ඇති වන අනෙකුත් ආරවුල් ;
   (ඇ) බලපත්‍රලාභියකු හා බලපෑමට ලක් වන වෙනත් යම් පාර්ශ්වකරුවකු අතර ඇති වන ආරවුල් ; සහ
   (ඈ) බලපත්‍රලාභියකු හා වෙනත් බලපත්‍රලාභියකු අතර ඇති වන ආරවුල්,

   වලට අදාළ වේ.

(2) ආරවුලකට සම්බන්ධ වූ I වන කොටසේ සඳහන් පරිදි පාර්ශ්වයන් අතර සමථයක් ඇති කර ගත නොහැකි වූ කොමිෂන් සභාව වෙත දන්වන ලද අවස්ථාවල දී එම ආරවුල් නිරවුල් කිරීමට අනුගමනය කළ යුතු වූ ද II වන කොටසේ නිශ්චිතව ම සඳහන් වූ ද කාර්ය පටිපාටියට අදාළ වේ.

I වන කොටස

**අ. 2(1) (අ), (ආ) සහ (ඇ) රීතිය යටතේ ගැනෙන ආරවුල් නිරවුල් කිරීම.**

3. 2(1)(අ),(ආ) හෝ (ඇ) රීතිය යටතේ නිශ්චිතව දක්වා ඇති ආකාරයේ ආරවුලක් බලපත්‍රලාභියකු සමග ඇති සහ එය විස ගැනීමට කැමැත්තක් ඇති යම් අයකුම පාරිභෝගිකයකු හෝ වෙන යම් බලපෑමකට ලක් වූ පාර්ශ්වයක් හෝ විසින් එම කාර්යය සඳ ලංකා විදුලිබල මණ්ඩලයේ, බෙදාහැරීම්, සම්ප්‍රේෂණ හෝ උත්පාදන බලපත්‍රලාභීන් වෙනුවෙන් අදාළ "නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි" හෝ ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙනුවෙන් "මෙහෙයුම් ප්‍රධානි" (මින් මතුවට "ආරවුල් නිරවුල් කිරීමේ නිලධරයා" ලෙස හඳුන්ව ලබන) වෙත, මෙම රීතිවල උපලේඛනයේ සඳහන් "අ" ආකෘතිපත්‍රයට සාරානුකූලව සකස් කළ ලිඛිත ඉල්ලීමක්, ආරවුලට සම්බ කාරණය හා එම කාරණය සම්බන්ධව එම අයකුම පාරිභෝගිකයා හෝ වෙන යම් බලපෑමකට ලක් වූ පාර්ශ්වයකට අදාළ යයි හැඟෙ වෙන යම් කරුණු ද එම ආරවුල නිරවුල් කිරීමට යෝජනාවක් ද ඇතුළත් කරමින්, යොමු කළ යුතු ය.

4. 3 වන රීතියේ සඳහන් ඉල්ලීම ලැබුනු දින සිට වැඩ කරන දින දහයක් (10) ඇතුළත, ආරවුලකට සම්බන්ධ දෙපාර්ශ්වය වූ

(i) අයකුම පාරිභෝගිකයා හෝ බලපෑමට ලක් වූ වෙනත් පාර්ශ්වය ; සහ

(ii) ආරවුලට මුල වූ කාරණය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයා (මින්මතු "අදාළ නිලධරයා" ලෙස හඳුන්වනු ලබ

අතර රැස්වීමක් පැවැත්වීමට ආරවුල් නිරවුල් කිරීමේ නිලධරයා විසින් පියවර ගත යුතු අතර එකී හමුවීමේ දී ආරවුල් නිරවුල් කිරී නිලධරයාගේ ද සහය ඇතිව ආරවුල විසඳීම තුළින් අන්‍යොන්‍යව පිළිගත හැකි විසඳුමකට ළඟා වීමට දෙපාර්ශ්වය ම උපරිම ප්‍රයත්න ද යුතු ය.

5. ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන්ට සමථයකට පැමිණීමට හැකි වූ විට, මෙම රීතිවල උපලේඛනයෙහි "ආ" ආකෘතිපත්‍ර සාරානුකූලව එකී සමථය ලිඛිතව සකසා දෙපාර්ශ්වය විසින් අත්සන තැබිය යුතු අතර එම නිරවුල් කිරීම සනාථ කිරීමට ආරවුල් නිරවු කිරීමේ නිලධරයා ද එයට අත්සන තැබිය යුතු ය.

6. 4 වන රීතියෙහි නිශ්චිතව දක්වා ඇති රැස්වීම කැඳවන දින සිට වැඩකරන දින දහයක් (10) ඇතුළත දෙපාර්ශවයට පිළි හැකි විසඳුමකට ඒමට ආරවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් අසමත් වන අවස්ථාවේ දී, මෙම රීතිවල උපලේඛන හි සඳහන් "ඇ" ආකෘතිපත්‍රයට සාරානුකූලව සකස් කළ ලියවිල්ලකට අත්සන් කළ යුතු අතර ආරවුල් නිරවුල් කිරීමේ නිලධරයා විසින් එය අනුමත ක යුතු ය.

**ආ. 2(1) (ඈ) රීතිය යටතේ ගැනෙන ආරවුල් විසඳීම.**

7. 2 (1) (ඈ) රීතිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති ආකාරයේ ආරවුලක් බලපත්‍රලාභියකු හා වෙනත් බලපත්‍රලාභියකු අ ඇති විට සහ එය නිරවුල් කිරීමට අපේක්ෂා කරන අය මේ රීතිවල උපලේඛනයෙ හි "අ" ආකෘතිපත්‍රයට සාරානුකූලව සකස් කළ ලිඛි ඉල්ලීමක් අනික් බලපත්‍රලාභියා වෙත යැවිය යුතු අතර ආරවුල හා සම්බන්ධ කාරණා හා අවස්ථානුකූලව බලපත්‍රලාභියා විසින් අදාළ ය සළකන වෙනත් කරුණු හා එම ආරවුල නිරවුල් කිරීමට යෝජනාවක් මෙයට ඇතුළත්ව තිබිය යුතු ය. ආරවුල් නිරවුල් කිරීමට ඔවුන් ප්‍රයත්නවල දී සහාය වීම සඳහා ඇගයුම්කරුවකු ලෙස කටයුතු කිරීමට දෙපාර්ශ්වයේ එකඟතාවය මත එක් පුද්ගලයකු තෝරා ගත හ වන පරිදි පුද්ගලයන් තිදෙනෙකුගේ නම් හා දුරකථන අංක ද එයට ඇතුළත් කළ යුතු ය.

8. අනෙක් පාර්ශවය විසින් එවන ලද පෙර සඳහන් 7 වන රීතියෙ හි නිශ්චිතව සඳහන් කර තිබෙන ලිඛිත ඉල්ලීම ලැබී ව කරන දින පහ (05) ක කාලයක් තුළ බලපත්‍රලාභීන් ඔවුන්ගේ ඇගයීම්කරු සමඟ සියලු පාර්ශ්වයන්ට පහසු ස්ථානයක දී හමුවිය යුතු අ එම රැස්වීමේ දී ආරවුල සම්බන්ධ පාර්ශ්වයන් විසින් ඇගයීම්කරුට ඔවුන්ගේ ආරවුල ඉදිරිපත් කළ යුතු ය.

9. ඇගයීම්කරුගේ සහාය සමගින් පාර්ශ්වකරුවන් සමථයකට පැමිණීම සඳහා සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු ය. ඇගයීම්කරු මතය බැඳීමක් ඇති නොකරන නමුත් සමථයකට පැමිණීම සඳහා පාර්ශ්වකරුවන් විසින් ප්‍රයත්නයන් දරන අවස්ථාවේ දී එම ම දෙපාර්ශ්වයම සැලකිල්ලට ගත යුතු ය.

10. පාර්ශවකරුවන්ට සමථයකට පැමිණීමට හැකි වූ අවස්ථාවක එම සමථය ලිඛිතව එම රීතිවල උපලේඛනයෙ හි "ආ" ආක පත්‍රයට සාරානුකූලව සකසා ආරවුලට සම්බන්ධ දෙපාර්ශ්වය විසින් අත්සන් කළ යුතු අතර ඇගයීම්කරු ද එම සමථය සනාථ කි සඳහා අත්සන් කළ යුතු ය.

11. රැස්වීමේ දින සිට වැඩ කරන දින දහය (10) ක කාලයක් තුළ දෙපාර්ශ්වයටම පිළිගත හැකි සමථයකට ළඟාවීමට ආරවු සම්බන්ධ පාර්ශ්වයන් අපොහොසත් වූ විට මෙහි උපලේඛනයෙහි සඳහන් කර තිබෙන "ඇ" ආකෘතිපත්‍රයට සාරානුකූලව සැ ලියවිල්ලකට අත්සන් කළ යුතු අතර ඇගයීම්කරු එය අනුමත කළ යුතු ය.

## II වන කොටස

12. I වන කොටසේ දක්වා ඇති ආරවුලකට සම්බන්ධ පාර්ශ්වයන්ට දෙපාර්ශ්වයටම පිළිගත හැකි සමථයකට පැමිණීමට නොහැකි වූ විට හා අවස්ථාවෝචිත පරිදි 6 වන හෝ 11 වන රීතිවල දක්වා ඇති ලේඛනයකට අත්සන් තබා ඇති විට, ආරවුලට සම්බන්ධ යම් පාර්ශවයක් මෙහි උපලේඛනයේ "ඈ" ආකෘතියට සාරානුකූලව සැකසූ ලිඛිත සන්නිවේදනයක් මගින් එකී අසමත් වීම කොමිෂන් සභාවට දැනුම් දිය හැකි අතර එය විසඳන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය යුතු ය.

13. කොමිෂන් සභාව වෙත 2(1) රීතියේ (අ) ඡේදය යටතට වැටෙන ආරවුලක් යොමු කර ඇති විට, එම යොමු කිරීමේ දින සිට වැඩ කරන දින පහ (5) ක් ඇතුළත, සමථයට පාදක වූ ප්‍රශ්නය විසඳීමේ කාරණය උදෙසා, මණ්ඩලයේ සභාපති විය යුතු කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ රාජ්‍ය නිලධරයකු අතුරින් එක් අයෙකු සහ ආරවුල සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් පළපුරුද්දක් සහිත විශ්‍රාමික රාජ්‍ය නිලධරයන් අතුරින් තෝරාගත යුතු සාමාජිකයන් දෙදෙනෙකු (2) ද ඇතුළත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු සමථකරුවන්ගේ මණ්ඩලයක් පත් කළ යුතු ය.

14. 2(1) වන රීතියෙහි (ආ), (ඇ) හා (ඈ) ඡේද යටතේ වන ආරවුලක් 12 වන රීතිය යටතේ කොමිෂන් සභාව වෙත යොමු කළ විට එම ආරවුල නිරවුල් කිරීමට වඩා යෝග්‍ය වන්නේ සමථකරනය ද නැතහොත් අධිකරණය හෝ බේරුම්කරණය මගින් විසඳීම ද යන්න තීරණය කිරීම සඳහා එම දැනුම්දීමෙන් වැඩ කරන දින පහ (5) ක් තුළ පූර්ව සමථකරණ තක්සේරුවක් කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු අතර -

(අ) උසාවිය හෝ බේරුම්කරණය මගින් ආරවුල විනිශ්චය කිරීම වඩාත් සුදුසු බව කොමිෂන් සභාව තීරණය කරයි නම්, යොමු කිරීම සිදු කළ දිනයේ සිට වැඩකරන දින දහය (10) ක් ඇතුළත එම තීරණය ආරවුල සම්බන්ධ පාර්ශ්වයන්ට සන්නිවේදනය කළ යුතු ය ; හෝ

(ආ) කොමිෂන් සභාව වෙනත් ලෙසකින් තීරණය කරයි නම්, 12 වන රීතිය යටතේ කරන ලද එම යොමු කිරීම, එම යොමු කිරීම සිදු කළ දින සිට වැඩකරන දින දහය (10) ක් තුළ, එම ආරවුල නිරවුල් කිරීමේ අරමුණින් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සමථකරුවන්ගේ මණ්ඩලයක් පත් කළ යුතු අතර ඔවුන් අතුරින් කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු හෝ රජයේ නිලධරයකු හෝ විය යුතු එක් තැනැත්තකු එකී මණ්ඩලයේ සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය. අනෙකුත් සාමාජිකයන් දෙදෙනා අදාළ ආරවුලට සම්බන්ධ වූ කාරණා පිළිබඳව පළපුරුද්දක් ඇති විශ්‍රාමික රජයේ නිලධරයන් අතුරින් පත් කරනු ලැබිය යුතු ය.

15. 13 හෝ 14 වන රීතීන් හි අරමුණ සඳහා සමථකරුවන් පත් කිරීමේ දී කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සුදුසුකම් හා පළපුරුද්ද එම පත් කරනු ලබන පුද්ගලයන් සතුව ඇතිදැයි කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු ය.

16. සමථකරුවන්ගේ මණ්ඩලය (මෙම රීති යටතේ පත් කරනු ලැබූ) ඔවුන් ඉදිරියේ ඇති ආරවුලක්, නිරවුල් කිරීමට පහසුකම් සැලැස්වීමේ දී පහත දක්වා තිබෙන පරිචය හා ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු ය :-

(අ) මෙම රීති යටතේ සමථකරුවන්ගේ මණ්ඩලය පත් කරනු ලැබූ දින සිට වැඩ කරන දින පහ (5) ක් ඇතුළත, ආරවුලට සම්බන්ධ පාර්ශවයන් හා ආරවුල් නිරවුල් කිරීමේ කාර්යය සඳහා පැමිණීම අවශ්‍යයැයි සලකන අනිකුත් පාර්ශවයන්ට, නිවේදනයේ සඳහන් කර තිබෙන වේලාවක දී හා ස්ථානයක දී තනිවම හෝ අදාළ පාර්ශ්ව හා එක්ව, සමථකරණ රැස්වීමට සහභාගි වන ලෙස ලිඛිතව දැනුම් දිය යුතු ය ;

(ආ) පාර්ශ්වකරුවන්ට, ආරවුල සම්බන්ධව සුහද සමථයකට පැමිණීමට පහසුකම් සැලසීම සඳහා, අවශ්‍ය යැයි සිතන සමථකරණ රැස්වීම් සංඛ්‍යාවක් කැඳවිය යුතු ය ;

(ඇ) පාර්ශ්වකරුවන් විසින් භාර දෙන ලද සියලු ලිපි ලේඛන හා තොරතුරුවලට හා සමථකරණ රැස්වීම පවත්වන අතරතුර හෙළිකරන ලද හා සාකච්ඡා කරන ලද වෙනත් සියලු කරුණු වලට ද අදාළ රහස්‍යභාවය රැක ගත යුතු ය ;

(ඈ) දෙපාර්ශ්වයටම පිළිගත හැකි විය යුතු වූ මිත්‍රශීලී සමථ කිරීමකට ළඟාවීමට, හැකිවෙන ලෙස ආරවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන්ට සුදුසු සවන්දීම් මගින් හා සන්නිවේදන හා සමථකරන හැකියාවන් යොදවමින්, ප්‍රයත්න දැරීම ;

(ඉ) සම්පූර්ණ සමථකරණ ක්‍රියාවලිය අතරතුර ස්වාධීනත්වය, මධ්‍යස්ථභාවය හා අපක්ෂපාතී බව රැක ගැනීම ;

(ඊ) සමථ මණ්ඩලය පත් කළ විට විශේෂයෙන් දක්වා තිබෙන කාලය තුළ නිසි ලෙස සාකච්ඡා අවසන් කිරීම ;

(උ) එකී නිසි සාකච්ඡා අවසානයේ :-

(i) පාර්ශ්වකරුවන් අතර සමථයක් ඇති කරගත්තේ නම්, එම පාර්ශ්වයන් අතර එකඟව ඇති කර ගන්නා ලද එකී සමථ කිරීම (උපලේඛනයේ "ඉ" ආකෘතිපත්‍රය අනුව) ලිඛිතව සකසා එම සමථයේ නියමයන්ට ඔවුන්ගේ එකඟතාවය දක්වමින් දෙපාර්ශ්වය ම ඔවුන්ගේ අත්සන් තැබිය යුතු අතර මෙම රීති යටතේ ආරවුල සමථයකට පත් වූ බව සහතික කරමින් සමථකරුවන්ගේ මණ්ඩලය ඔවුන්ගේ අත්සන තැබිය යුතු ය ; හෝ

(ii) පාර්ශ්වකරුවන් අතර සමථයකට පැමිණිය නොහැකි නම් සමථකරණය මගින් ආරවුල විසඳීමට ප්‍රයත්නයක් ගෙන තිබුණත් එය අපොහොසත් වූ බවට සහතික කරමින් කොමිෂන් සභාව විසින් "නිරවුල් නොවීමේ සහතිකය" (උපලේඛනයේ "ඊ" ආකෘතිපත්‍රය අනුව සැකසූ) නිකුත් කළ යුතු ය.

17. සමථකරුවන්ගේ මණ්ඩලය විසින් සමථකරණයට සහ ආරවුල නිරවුල් කිරීමට කරන ලද සියලු නිසි උත්සාහයන් අවසානයෙ කොමිෂන් සභාව විසින් තමන්ට දැරීමට සිදු වූ පිරිවැය හා වියදම්වලට අදාළ මුදල් දෙපාර්ශවයන්ගෙන් අය කරනු ලැබිය හැකි ය. එස එක් පාර්ශවයකින් අය කළ යුතු ප්‍රමාණය හා පියවා ගත යුතු සාමානුපාතික කොටස කොමිෂන් සභාව විසින් පාර්ශවකරුවන්ගෙ සමථකරණ ක්‍රියාවලියේ දී හැසිරීම හා පාර්ශවයන්ගේ ගෙවීමේ හැකියාව හා වෙනත් අදාළ තත්ත්වයන් අනුව තීරණය කළ යුතු ය. අය කර ගත යුතු ප්‍රමාණය තීරණය කිරීම සඳහා පහත දැක්වෙන නිර්නායක අනුගමනය කළ යුතු ය :-

(අ) 2 (1) වන රීතියෙ හි (අ) ඡේදය යටතේ වන ආරවුල් - ආරවුල හා සම්බන්ධ පාර්ශවකරුවන්ගෙන් පිරිවැය හා වියදම් අය කර නොගත යුතු ය ;

(ආ) 2 (1) වන රීතියෙ හි (ආ) හා (ඇ) ඡේදය යටතේ වන ආරවුල් - ආරවුල හා සම්බන්ධව පැවැත්වූ පළමු සමථකරන සාකච්ඡාව අවසානයේ ආරවුලට සම්බන්ධ පාර්ශවයන් අන්‍යොන්‍ය සමථයකට එළඹියේ නම් පිරිවැය හෝ වියදම් අය කර නොගත යුතු අතර එවැනි සමථයකට නොඑළඹියේ නම්, කොමිෂන් සභාව විසින් දරනු ලැබූ පිරිවැය හෝ වියදම් පාර්ශ්වයන්ගෙන් සමානුපාතිකව අයකර ගත යුතු ය ;

(ඇ) 2 (1) වන රීතියේ හි (ඇ) ඡේදය යටතේ වන ආරවුල් - කොමිෂන් සභාව විසින් දරනු ලැබූ පිරිවැය හා වියදම් දෙපාර්ශ්වයන්ගෙන් සමානුපාතිකව අයකර ගත යුතු ය.

18. මේ රීති යටතේ ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන් අතර සියලු සන්නිවේදනයන් ලිඛිතව තිබිය යුතු අතර ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල වැනි වෙනත් සේවාවන් සඳහා පාර්ශ්වයන් එකඟ නොවූයේ නම් එකී සියලු සන්නිවේදන ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. මෙහි දී එය තැපැල් කරන ලද දිනට පසුවම වූ තැපැල බෙදන දිනයේ දී අනික් පාර්ශ්වයට ලැබුනු බවට සැළකිය යුතු ය. පාර්ශ්වයන් විසින් වෙනත් සේවා මාර්ගයක් සඳහා එකඟ වන අවස්ථාවක දී, අනික් පාර්ශවය විසින් එය ලද බවට පිළිගැනීමක් කරනු ලැබුවේ නම් පමණක් එසේ සන්නිවේදනය වූ බවට සළකනු ලැබිය යුතු ය.

19. ලියාපදිංචි තැපෑල, ෆැක්ස්, විද්‍යුත් තැපෑල හෝ කොමිෂන් සභාව සතු වෙනත් සන්නිවේදන ක්‍රමයක් හරහා විමසීම්, සන්නිවේදනයන් හා භාරදීම ඉදිරිපත් කිරීම් කොමිෂන් සභාව වෙත සිදු කරනු ලැබිය හැකි ය. ලියාපදිංචි තැපෑලෙන් හැර ඉහතින් දක්වන ලද ඕනෑම සන්නිවේදන මාධ්‍යයක් හරහා සිදු කරන විමසීම්, සන්නිවේදනයන් භාරදීම් හා ඉදිරිපත් කිරීම් කොමිෂන් සභාව විසින් එය ලද බවට පිළිගැනීමත් සමග, ලැබූ ලෙස සළකනු ලැබිය යුතු ය.

20. මෙම රීතිවල කවර හෝ විධිවිධානයක් හෝ මෙහි යම් රීතියක් යටතේ පනවා තිබෙන යම් නියමයක් උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තෙක්ම මෙම පනත යටතේ වරදක් සිදු කරනු ලැබූ බවට සළකනු ලැබිය යුතු ය.

21. මෙම රීතිවල, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''පනත'' යන්නෙන්, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අදහස් වේ ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදහස් වේ ;

''ආරවුල'' යන්නෙන් බලපත්‍රලාභියකු හා අයකුම පාරිභෝගිකයකු අතර, බලපත්‍රලාභියකු හා වෙනත් බලපත්‍රලාභියකු අතර හෝ බලපත්‍රලාභියකු හා වෙනත් බලපෑමට ලක් වූ පාර්ශ්වයක් අතර පනතේ 39 වන වගන්තියේ හි (1) වන උපවගන්තියෙහි සඳහන් කර තිබෙන පරිදි විදුලිය සැපයුම හෝ භාවිතය සම්බන්ධව ඇති වන මතභේදයක් අදහස් වේ ;

''බෙදාහැරීම් බලපත්‍රලාභියා'' යන්නෙන් බෙදාහැරීම් බලපත්‍රයක් දෙනු ලැබ ඇති තැනැත්තකු අදහස් වේ ;

''බලපත්‍රලාභියා'' යන්නෙන් පනත යටතේ උත්පාදන, සම්ප්‍රේෂණ හෝ බෙදාහැරීම් බලපත්‍රයක් ලබා දෙනු ලැබූ තැනැත්තකු අදහස් වේ ;

''අයකුම පාරිභෝගිකයා'' යන්නෙන්, පනතේ 25 වන වගන්තිය යටතේ බෙදාහැරීම් බලපත්‍රලාභියකු වෙතින් විදුලි සැපයුම ඉල්ලා සිටිනු ලැබූ ද ඒ අනුව බෙදාහැරීම් බලපත්‍රලාභියා විසින් විදුලිය සපයන ලද ''තැනැත්තෙකු'' අදහස් වේ.

උපලේඛනය

[3 වන සහ 7 වන රීති]

"අ" ආකෘති පත්‍රය

[අයකුම පාරිභෝගිකයා හෝ අනෙකුත් බලපෑමට ලක්වූ පාර්ශ්වය හෝ බලපත්‍රලාභියා - 1 ගේ තැපැල් ලිපිනය]
[දුරකථන අංකය]

[විදුලි ගිණුම් අංකය (අයකුම පාරිභෝගිකයෙක් වන අවස්ථාවේ දී) හෝ පාර්ශ්වයන් අතර එළඹී ඇති ගිවිසුමක යොමු අංකය (තිබේ නම්)]

[අදාළ නිලධරයාගෙන් ලබාගත් පැමිණිල්ලේ යොමු අංකය (අයකුම පාරිභෝගිකයා හෝ අනෙකුත් බලපෑමට පත් වූ පාර්ශ්වයක් සම්බන්ධයෙන්)

[දිනය]
[නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන්)]
බෙදාහැරීමට අදාළ පළාතේ නම
හෝ

[මෙහෙයුම් ප්‍රධානී (ල.වි.පෞ. සමාගම වූ විට)]
හෝ
[නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)]
හෝ
[නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උත්පාදන)]
හෝ

බලපත්‍රලාභියා - 2

[තැපැල් ලිපිනය]

**ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන් විසින් එම ආරවුල් විසඳීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකසන ලද විදුලිබල (නිරවුල් කිරීමේ කාර්ය පටිපාටිය) රීතිහි 1 වන [illegible] ප්‍රකාරව, පහත දක්වා තිබෙන ආරවුල විසඳීම සඳහා ඔබගේ මැදිහත් වීම මම මෙයින් ඉල්ලා සිටිමි :-

(අ) ආරවුල සම්බන්ධ ගැටළුව පැහැදිළි කිරීම :
(ආ) අදාළ නිළධරයා හෝ ආරවුලට සම්බන්ධ වෙනත් නිලධරයෙකුගේ විස්තර (බලපත්‍රලාභියා - 1 හෝ බලපත්‍රලාභියා - 2 ට අදාළ නොවේ) :
(ඇ) ආරවුලට සම්බන්ධ කරුණු (ඉහත "අ" යටතේ ලබා දුන් විස්තර කිරීම් වලට අමතරව) :
(ඈ) විසඳුම සඳහා යෝජනාව :
(ඉ) නම් තුනක් යෝජනා කර එක් අයෙකු ඇගයීම්කරු ලෙස තෝරා ගත යුතු ය. (බලපත්‍රලාභියා - 1 හෝ බලපත්‍රලාභියා - 2 සඳහා පමණි) :

1. ..................................................
2. ..................................................
3. ..................................................

[illegible] දක්වා තිබෙන කොන්දේසි ප්‍රකාරව මේ සම්බන්ධයෙන් නියම කර ලද රැස්වීම පිළිබඳ තොරතුරු ඉහත දක්වා තිබෙන [illegible] හරහා මා වෙත දන්වන්න.

..................................................
(ආරවුලට සම්බන්ධ පාර්ශ්වයේ නම)